- **14 ඒකකය - තාපය හා උෂ්ණත්වය** යටතේ **පිටු අංක 41** හා **පිටු අංක 42** යටතේ ඇති **ක්‍රියාකාරකම 14.1** හා **ක්‍රියාකාරකම 14.2** නිවසේ සිටින වැඩිහිටියෙකුගේ සහය ඇතුව කරන්න.
- පදාර්ථයේ අවස්ථා වෙනස්වීමේ දී පවතින නිශ්චිත උෂ්ණත්ව ප්‍රමාණයක් සෙවීමට සිදුකරන ලද ක්‍රියාකාරකම් දෙකක් පහත දැක්වේ.



රූපය 01



රූපය 02

01. පළමු රූපය හා පෙළ පොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.
   - i a, b, හා c යන විද්‍යාගාර උපකරණ නම් කරන්න.
   - ii ඝන ද්‍රව්‍යයක් එහි ද්‍රව අවස්ථාවට පත්වන නිශ්චිත උෂ්ණත්වය කවර නමකින් හැඳින්වේ ද?
   - iii අයිස් දියවන උෂ්ණත්වය (අයිස්වල ද්‍රවාංකය) කොපමණ ද?

02. දෙවන රූපය හා පෙළ පොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.
   - i a, b, c හා d යන විද්‍යාගාර උපකරණ නම් කරන්න.
   - ii ද්‍රවයක් වායුවක් බවට නිශ්චිත උෂ්ණත්වය හඳුන්වන නම කුමක් ද?
   - iii ජලය වාෂ්ප වන (ජලය නටන) උෂ්ණත්වය කොපමණ ද?

03. පහත රූපයේ දැක්වෙන්නේ ඝන ද්‍රව්‍ය තුළින් තාප සංක්‍රමණය වන ආකාරය සෙවීමට සිදු කළ ක්‍රියාකාරකමකි.



- i මෙම ක්‍රියාකාරකමේ දී ලැබෙන නිරීක්ෂණයක් සඳහන් කරන්න.
- ii ඉහත නිරීක්ෂණ තුළින් ලබාගත හැකි නිගමනය සඳහන් කරන්න.
- iii ඝන ද්‍රව්‍ය තුළින් තාපය සංක්‍රමණය වන ක්‍රමය කවර නමකින් හඳුන්වයි ද?